# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.11.29 පැය 2340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 2147/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. නායයාම හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් තිදෙනෙකු අතුරුදන්වීම- යටියන්තොට පොලිස් වසම.**

2025.11.28 වන දින යටියන්තොට පොලිස් වසමේ බෙරන්නාව ප්‍රදේශයේ නිවාස 02ක් නායයාමට ලක්ව පුද්ගලයින් තිදෙනෙකු අතුරුදන්ව ඇති අතර 2025.11.29 වන අද දින අතුරුදන් වූ එක් පුද්ගලයෙකුගේ මළසිරුර හමුවී ඇත.

අතුරුදන් වූ අයවලුන් සොයා යටියන්තොට පොලිසිය මෙහෙයුමක් ක්‍රියාත්මක කර ඇත.

**02. සැඩ පහරකට හසුව ළමුන් දෙදෙනෙකු අතුරුදන්වීම- මුන්දලම පොලිස් වසම.**

2025.11.28 වන දින උදෑසන කාලයේ මුන්දලම පොලිස් වසමේ පුලිච්චාකුලම් ප්‍රදේශයේ ඇල මාර්ගයක් උතුරා මාර්ගය හරහා විශාල ලෙස ගමන් කරන ජලය නැරඹීම සඳහා මිතුරන් පිරිසක් සමග ගිය ළමයෙකු එම ඇලේ ජල පහරට හසුවී ඇති අතර ඔහු බේරා ගැනීමට උත්සහ කල මිතුරාද එම ජල පහරට හසුව දෙදෙනාම ගසා ගෙන ගොස් අතුරුදන් වී ඇත.

**අතුරුදන්වූ ළමුන් දෙදෙනා අවුරුදු 13 වයසේ පසුවන බත්තුළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අතුරුදන් වූ අයවලුන් සොයා මුන්දලම පොලිසිය මෙහෙයුමක් ක්‍රියාත්මක කර ඇත.

**03. මෘත ශරීරයක් හමුවීම- අලව්ව පොලිස් වසම.**

2025.11.29 වන අද දින උදෑසන කාලයේ අලව්ව පොලිස් වසමේ වලාකුඹුර ප්‍රදේශයේ වෙල් යායක වැටී මියගොස් සිටි පුද්ගලයෙකුගේ මළ සිරුරක් ඇති බවට අලව්ව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ අලව්ව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අලව්ව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**